ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය - **2018**

---

**තත්ත්වාගණනය කළ මතය**

---

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ .

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය

විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ

- අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම

හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ප්‍රමිත අංක 02 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා ගෙවන ලද රු. 317,927,747 ක්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ රු. 315,740,727 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ගලායාම් රු. 2,187,020 ක් අඩුවෙන් දක්වා තිබුණි. පශු සම්පත් මිලදී ගැනීම සඳහා ගෙවන ලද රු. 680,825 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි. | මෙම දෝෂය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ගිණුම් නිවැරදි කල යුතුය. |
| (ආ) ප්‍රමිත අංක 07 ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පවතින පිරිවැය රු. 760,570,621 ක් වූ ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් එම ස්ථාවර වත්කම් වල ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත් වූ විගස මෙම අඩුපාඩුව ඉදිරියේදී නිවැරදි කිරීමට හැකිවනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ගිණුම් නිවැරදි කල යුතුය. |
| (ඇ) ප්‍රමිත අංක 01 ප්‍රකාරව අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබුණු 2008 වර්ෂයට පෙර සිට ලැබිය යුතු ලෙස ඉදිරියට ගෙන එන ලද රු. 189,303 ක් වූ කෘෂි විද්‍යාපීඨයේ මූල්‍ය අක්‍රමිකතාවය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | එම මූල්‍ය අක්‍රමිකතාවය පිළිබඳව බදුල්ල අධිකරණයේ නඩුවක් දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු අනාවරණය කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේදී බාහිර පාර්ශවයකින් වෛද්‍ය පීඨය සඳහා පරිත්‍යාග වශයෙන් ලැබුණු වෛද්‍ය හා කාර්යාල උපකරණවල වර්ග 59 ක් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍යවල වර්ග 12 ක වටිනාකම තක්සේරුකර ගිණුම් වලට ගෙන නොතිබුණි. | මෙම අයිතම නිවැරදිව හඳුනාගෙන ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම් නිවැරදි කල යුතුය |

| | | |
|---|---|---|
| (ආ) විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ 2015, 2016 හා 2017 වර්ෂවල ඇස්තමේන්තුගත ගෙවිය යුතු පුනරාවර්තන වියදම් රු. 3,088,147 කින් සමාලෝචිත වර්ෂයේ දී රු. 2,176,108 ගෙවා තිබූ නමුත් රු. 912,039 ක් වූ අධි ඇස්තමේන්තුගත ගෙවිය යුතු ශේෂය නැවත ගිණුම්වලින් ගලපා නොතිබුණි. | ඉතිරි රු. 912,039/- මුදල අධි ඇස්තමේන්තුවක් නොවන අතර එහි බිල්පත් ඉදිරිපත් නොවූ වියදම් ඇතුලත් වී ඇත. මෙම වියදම් ඉදිරියේදී දැරීමට සිදුවිය හැකි බැවින් ගිණුම් වල වගකීම් ලෙස ඉදිරිපත් කොට ඇත. | ගිණුම් නිවැරදි කල යුතුය |

## 1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2011 සිට 2012 වර්ෂය දක්වා කාලසීමාව සඳහා ආරක්ෂක සේවා ගිවිසුම් කොන්දේසි වලට පටහැනිව රු. 9,432,774 ක් අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම අනුව ආරක්ෂක සේවා සමාගම වෙත ගෙවා තිබීම නීත්‍යානුකූල නොවන ගෙවීමක් බව 2017 අගෝස්තු 09 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින්ද පිළිගෙන තිබුණි. | 2017 ජූලි මාසයේ පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී මේ සඳහා පිළිතුරු ලබා දී ඇති බැවින් මෙම විගණන විමසුම ඉවත්කර ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකල වගකිව යුතු අය හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් නිත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ)විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ගෙවිය යුතු රු. 36,591,054 ක් කපා හැරීම සඳහා විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය ලබා ගෙන තිබුණද රු. 37,406,856 ක් කපා හැර තිබීම හේතුවෙන් රු. 554,500 ක් පාලක සභාවේ අනුමැතියකින් තොරව කපා හැර තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට මෙම මුදල අයවීමට නොමැති බව 2017 වර්ෂයේදී වාර්තා කර ඇති අතර ඒ අනුව විශ්වවිද්‍යාලයේ ආදායමට 2018 වර්ෂයේදී ගලපන ලදි. | නිසි සනාථ කිරීමකින් හා පාලක සභා අනුමැතියකින් තොරව ණය ශේෂයන් කපාහැරීම නොකළ යුතුය. |

## 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනයට මෘදුකාංග සැකසීම වෙනුවෙන් ආයතනයකට 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එකතුව රු. 1,368,300 ක් ගෙවා තිබුණි. එක් ආයතනයක් සකසන මෘදුකාංගයට දත්ත ඇතුලත් කිරීමට වෙනත් ආයතනයකට ලබා දීම හේතුවෙන් ඇති වී තිබූ ගැටළු සහගත තත්ත්වය මත සමාලෝචිත වර්ෂය සඳහා වූ | විදුලිබල මණ්ඩලයට අයත්ව තිබූ අනුබද්ධ විශ්වවිද්‍යාලය පවත්වාගෙන එන ලද ඉඩම් වල මෙම විශ්වවිද්‍යාලය පවත්වාගෙන යන අතර ඉඩම් පවරා ගැනීමේ කටයුතු කෙරීගෙන යයි. සියලුම ස්ථාවර වත්කම් නැවත | ස්ථාවර වත්කම් ලේඛනය කඩිනමින් සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 4,580,063,405 ක් වූ ස්ථාවර වත්කම් සනාථ කර ගැනීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් නොතිබුණි. | භෞතිකව සත්‍යාපනය කර ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කරමින් පවතින අතර එවිට මෙම අඩුපාඩු ඉවත් කල හැක. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1999 හා 2016 වර්ෂ අතර කාලයට අයත් සේවකයින් 09 දෙනෙකුගේ රු. 484,996 ක් වූ උත්සව අත්තිකාරම්, ආපදා ණය, පරිගණක ණය, වාහන ණය හා සේවක ණය ශේෂ 18 ක් 2019 මැයි වනවිටත් අයකර ගෙන නොතිබුණි. | මෙම සේවක ණය සියල්ලම නිකුත් කොට ඇත්තේ ඔවුන්ගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල ඇපයට තබාගෙන වන අතර එම සේවක අර්ථසාධක අරමුල නිදහස් කිරීමේ දී අදාල ණය මුදල පොලිය සමඟ අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අය කර ගැනීමට නොහැකි වී ඇති හේතු හඳුනාගෙන අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එන එකතුව රු. 69,617,688 ක් වූ විවිධ ණය හිමි ශේෂ 08 ක් නිරවුල් කිරීමට 2019 මැයි වනවිටත් කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයට ඇතුලත් වී ඇති රු. 860,883 ක් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් විසින් ගොනු කර ඇති නඩු අවසන් වන තෙක් අදාල මුදල් ගෙවිය නොහැක. ඉතිරි මුදල 2010 සිට 2016 දක්වා අවසනා කරන ලද ඉදිකිරීම්වල අවසාන බිල්පත් ඉදිරිපත් කළ පසු ගෙවා නිම කල හැක. | නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 112(1) වගන්තිය | 2018 ජුලි මාසයේදී කාලය අවසන් වී තිබුණු සමාජ විද්‍යා හා භාෂා අධ්‍යයන පීඨයේ සහ භූ විඥාපන පීඨවල 2016/2017 අධ්‍යයන වර්ෂයේ ශිෂ්‍ය සභාව සඳහා ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික තනතුර පුරප්පාඩුව පැවතීම හේතුවෙන් 2019 මැයි වන විටත් එම සභා ක්‍රියාකාරී තත්ත්වයට පත්කර නොතිබුණි. | මේ වනවිට එම පීඨයන්හි ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික තනතුර ආචාර්යවරුන් විසින් භාර ගෙන ඇත. | පනතේ විධිවිධාන පරිදි කටයුතු සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | | | |
| (i) V වැනි පරිච්ඡේදයේ 7.6 වගන්තිය | 2000 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වී සේවයට වාර්තා නොකරන ලද නිළධාරීන් 13 දෙනෙකුගේ බැඳුම්කර කඩකිරීම හේතුවෙන් අයකර ගත යුතු රු. 67,791,476 ක් 2019 මැයි වන විටත් අය කරගෙන නොතිබුණි. මෙයින් බැඳුම්කර කඩකළ නිළධාරීන් 04 දෙනෙකුගෙන් අය කළ යුතු එකතු රු. 20,424,786 කින් කිසිදු මුදලක් අයකර නොමැති අතර වාරික වශයෙන් ගෙවීමට එකඟ වූ නිළධාරීන් 07 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු. 40,552,792 ක් 2016 වර්ෂයේ සිට කිසිදු වාරිකයක් අයකර ගෙන නොතිබුණි. | බැඳුම්කර කඩකරන ලද ආචාර්යවරු 03 දෙනෙකුට එරෙහිව නඩු ගොනු කිරීමට ද, 06 දෙනෙක් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කිරීමට ද, 06 දෙනෙකුට වාරික මුදල් ගෙවන ලෙස සිහිකැඳවීම් ලිපි නිකුත් කිරීමට ද, දෙදෙනෙක් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ නීති අංශයට යොමු කිරීමට ද කටයුතු කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කර මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සනාථ කර ගැනීමකින් තොරව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 343 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු. 655,885,589 ක් ගෙවා තිබුණි. | අධ්‍යයන කාර්යය මණ්ඩලය දිනපතා පැමිණීම හා පිටවීම සටහන් කිරීම සිදු නොවන නමුත් අදාල අධ්‍යයනාංශවල අංශ ප්‍රධානීන් මඟින් ආචාර්යවරුන්ගේ සේවය සතුටුදායක බව සනාථ කිරීමෙන් පසුව වැටුප් සකස් කරනු ලබයි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) xxvi වැනි පරිච්ඡේදයේ 4 වගන්තිය | 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ප්‍රධාන පුස්තකාලය, කෘෂි විද්‍යා පීඨ හා කළමනාකරණ පීඨවල පුස්තකාල වල පැවති හඳුනා ගන්නා ලද පාවිච්චි කළ නොහැකි පරිගණක හා කාර්යාල උපකරණ 46 ක් අපහරණය කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටද කටයුතු කර නොතිබුණි. | අපහරණය කිරීමට නියමිත භාණ්ඩ වෙන්කර තැබීමට කටයුතු කර ඇති අතර ප්‍රධාන ගබඩාවේ ඉඩකඩ නොමැති බැවින් ඒවා රැගෙන යන තෙක් තම තමන්ගේ පරිශ්‍රයේ තබා ගැනීමට සිදු වී ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 104 (1) | කෘෂි විද්‍යා පීඨ පුස්තකාලයේ පොත් සංගණනය කර වාර්තාවක් සැකසීම සඳහා පත් කල කමිටුවේ වාර්තාව අනුව 1998 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුල අස්ථානගත වී ඇති වටිනාකම රු. 475,148 ක් වූ පොත් 1,085 ක් සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් 31 දක්වා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අදාල පොත් පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව තක්සේරුවක් කර අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 156(1) | විශ්වවිද්‍යාලයේ 2017 ජනවාරි සිට 2018 අගෝස්තු දක්වා තොග විදුලි බිල්පත් නියමිත පරිදි නොගෙවීම හේතුවෙන් ගෙවිය යුතු රු. 72,484 ක් ප්‍රමාද ගාස්තු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබීම මත නියමිත දිනට විදුලිබිල ගෙවීමට නොහැකි වීම මත මෙම ප්‍රමාද ගාස්තු ඇතුලත්කොට තිබුණ ද මෙම මුදල මෙතෙක් ගෙවා නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) මුදල් රෙගුලාසි 571(1), (2) හා (3) | 2009 - 2015 කාල පරිච්ඡේදයට අදාල ටෙන්ඩර් තැන්පතු, රැඳවුම් මුදල්, ලංසු සුරක්ෂණ, විවිධ තැන්පතු සහ කාර්යසාධන සුරක්ෂණ ඇතුළත් රු. 5,407,432 ක් වටිනා කල් ඉකුත් වූ තැන්පතු 111 ක් නියාදනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ටෙන්ඩර් තැන්පතු, රැඳවුම් මුදල්, ලංසු සුරක්ෂා, කාර්ය සාධන සුරක්ෂා වසර 5 කට වඩා පැරණි වූ විට මුදල් රෙගුලාසි ප්‍රකාරව නියාදනය කර ඇත. විවිධ තැන්පත් පමණක් වසර 5 කට වරක් නියාදනය කර නොමැති | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අතර ඒවා ඉදිරියේ දී ඉවත් කරනු ලැබේ. | |
| (ඇ)2016 ජුනි 17 දිනැති අංක 06/2016 දරන රජයේ මුදල් චක්‍රලේඛයේ 02 වගන්තිය | විශ්වවිද්‍යාලයේ පෞද්ගලික ආරක්ෂක සේවය සැපයීම සඳහා අවස්ථා තුනකදී නිකුත් කරන ලද ලංසු 57 ක් සඳහා රු. 12,500 ට වඩා අඩු ගාස්තුවක් අයකිරීම හේතුවෙන් රු. 564,500 ක මුදලක් විශ්වවිද්‍යාල අරමුදලට අහිමි වී තිබුණි. | මේ සඳහා මීට පෙර අයකරන ලද ගාස්තු පදනම් කරගෙන ඇති බව හා ඉදිරියේදී එම ගාස්තු අනුව කටයුතු කරන බවත් දන්වා ඇත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ)2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛයේ 04 පරිච්ඡේදයේ (ii) හා (iii) වගන්ති | ව්‍යාපෘති යෝජනාවේ ඇතුලත් ක්‍රියාකාරී සැලැස්මට අනුව සකසන ලද අර්ධ වාර්ෂික ප්‍රගති වාර්ථා (Interim reports) හෝ අවසන් පර්යේෂණ වාර්තා හෝ ඉදිරිපත් කිරීමකින් තොරව පර්යේෂණ දීමනා ලෙස (Research Allowance) ඉකුත් වර්ෂයේදී නිලධාරීන් 188 ක් වෙනුවෙන් රු. 39,230,761 ක් සහ සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 221 ක් වෙනුවෙන් රු. 49,414,966 ක් අධ්‍යයන හා පරිපාලන කාර්යමණ්ඩලයට ගෙවා තිබුණි. | අන්තර් විශ්වවිද්‍යාලීය ආචාර්ය සමිති සංගමයේ නියමය පරිදි සබරගමුව විශ්වවිද්‍යාලයේ ආචාර්ය සංගමය වෙත මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් නොකරන ලෙස දන්වා ඇත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඊ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ -------------- | | | |
| (i) 2018 ජූලි 05 දිනැති අංක 05/2018 දරන විශ්වවිද්‍යාල පද්ධති තුල පර්යේෂකයන් හඳුනා ගැනීම සඳහා වූ විනිවිධභාවයෙන් යුතු පර්යේෂණ කාර්යසාධන ප්‍රවේශය නම් වූ චක්‍රලේඛය | චක්‍රලේඛයට අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පර්යේෂකයන් හඳුනා ගැනීම සඳහා ක්‍රියාමාර්ග යොදා ගෙන නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ වාර්ෂිකව පැවැත්වෙන විශ්වවිද්‍යාලීය දිනයේදී දක්ෂතම පර්යේෂකයන් හඳුනාගෙන ඔවුන් ඇගයීමට ලක්කිරීමේ ක්‍රමවේදයක් විශ්වවිද්‍යාලීය පර්යේෂණ අරමුදල් කමිටුව විසින් ක්‍රියාත්මක කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ii) 2015 මැයි 07 දිනැති අංක | විශ්වවිද්‍යාලයේ පීඨ 06 ක, අධ්‍යනාංශ 19 ක, උපාධි | මෙය සකස් කර පාලක සභාවේ සහ සනාථන | අදාල සැලැස්ම |

| | | | |
|---|---|---|---|
| UGC/AC/AQ/Gen දරන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය පද්ධතියේ අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා වූ ආචාරධර්ම හා අධ්‍යයන වගවීමේ චක්‍රලේඛය | පාඨමාලා 42 ක් සඳහා දේශණ ප්‍රතිමාණ සැලැස්ම 2016 වර්ෂයේ සිට 2019 මැයි දක්වා (Lecture Norms plan ) පිළියෙල කර නොතිබුණු අතර එම නිසා අධ්‍යනාංශවල දේශන පැවැත්වීමේ කාර්යසාධනය ඇගයීමට නොහැකි විය. | සභාවේ අනුමැතියට මෙම වර්ෂය තුලදී ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | පිළියෙල කර පාලක සභාව මගින් අනුමත කළ යුතුය. |
| (iii) 2012 අප්‍රේල් 23 දිනැති අංක 981 දරන චක්‍රලේඛයේ 3 වගන්තිය | ප්‍රශ්න පත්‍ර යතුරු ලියනය කිරීමේදී එක් පිටුවකට 100 බැගින් උපරිමයකට යටත්ව ආචාර්යවරුන්ට ගෙවිය හැකි නමුත් ප්‍රශ්න පත්‍ර පරිගණක ගත කිරීම වෙනුවෙන් විභාග අංශයේ පරිගණක යෙදවුම් සහයකවරියන් වෙත සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ රු. 371,400 ක අමතර ගෙවීමක් කර තිබුණි. | ආචාර්යවරුන් කරනු ලබන යතුරුලියනය සඳහා ගාස්තු අදාල ආචාර්යවරුන්ටත්, අනෙකුත් නිලධාරීන් කරනු ලබන යතුරුලියනය සඳහා ගාස්තු එම නිලධාරීන්ටත් ගෙවනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |

## 1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 5(2)(ඌ) සහ 27 වගන්ති ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතු ආචාර්යවරුන් සහ පරිපාලන නිළධාරීන් 236 කගේ උපයන විට ගෙවීම් බදු ගණනය කිරීමේදී විශ්වවිද්‍යාලය විසින් සපයන ලද නිල නිවාස පහසුකම්, ප්‍රවාහන පහසුකම්වල වටිනාකම 2018 දෙසැම්බර් 31 දක්වාම සැලකිල්ලට ගෙන නොතිබුණි. | විගණන හා කළමණාකරණ කමිටුවේ තීරණයට අනුව මෙම නිල නිවාස මූල්‍ය නොවන ප්‍රතිලාභ ගණයට ඇතුලත් කර බදු ගණනය කර සේවක වැටුපෙන් අඩු කර දේශීය අදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමට කටයුතු කර ඇත. | පනතේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 60,546,285 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 83,683,310 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 23,137,025 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය, නඩත්තු වියදම් සහ ගිවිසුම්ගත සේවා රු. 20,420,488 ක් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රජයේ ප්‍රධාන, විලම්භිත ආදායම් හා මහපොල ශිෂ්‍යාධාර හැර විශ්වවිද්‍යාලයේ ආදායම රු. 40,668,262 කින්ද ක්ෂය හා මහපොල ශිෂ්‍යාධාර හැර වියදම රු. 207,742,414 කින්ද රජයේ ප්‍රධාන රු. 199,563,000 කින්ද වැඩි වී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ආයතනයේ ජංගම අනුපාතය 1:1 ක් වූ අතර 2017 වසරේ එය 1:0.42 ක් විය. සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම්වලින් සියයට 20 ක් මුදල් හා මුදල් සමාන දෑ වලින් නියෝජනය වූයෙන් ආයතනයේ සැලකිය යුතු වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුළ රඳවා ගෙන තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1996 වර්ෂයට පෙර බුත්තල අනුබද්ධ විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේදී අස්ථානගතවූ බවට හඳුනාගෙන තිබුණු රු. 48,150 ක් වූ පොත් 600 ක් සඳහා පරිග්‍රහණ අංකය ඉදිරියෙන් "m" අක්ෂරය යොදා තිබුණද ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග 2019 මැයි වනවිටත් ගෙන නොතිබුණි. | පොත් අස්ථානගත වීම සම්බන්ධයෙන් පත් කරන ලද විමර්ශන කමිටු වාර්තාව අනුව එම පුස්තකාලයට ස්ථිර වශයෙන් වගකිව යුතු නිළධාරියෙකු 1996 ජූලි 01 වන තෙක් පත්කර නොමැති වීම මෙම අස්ථානගත වීමට හේතු ලෙස දක්වා ඇති අතර අස්ථානගත වූ පොත් සඳහා පරිග්‍රහණ ලේඛණයෙහි "m" අක්ෂරය යොදා ඇත. | ප්‍රායෝගික තත්ත්වය අනුව අස්ථාන ගත වූ පොත් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2014 වර්ෂයේදී රු.123,052,693 ක් වැයකර ඉදිකර තිබුණු විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා පිටිය සහ ක්‍රීඩාගාරයේ පැවති අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු බවට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2017 අගෝස්තු 09 දින නියෝග කර තිබුණද, වටිනාකම රු. 5,156,160 ක් වූ රඳවා ගැනීමේ මුදල් භාවිතා කර ක්‍රීඩා පිටිය පිළිසකර කිරීමට සහ මාස 06 ක කාලයක් නොකඩවා ක්‍රීඩා පිටියේ | මෙම රඳවා ගැනීමේ මුදලින් පිට්ටනිය සකස් කර ගැනීමේ හැකියාවක් නොමැති අතර ඉදිරි වර්ෂ වලදී මෙම කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන අතර එතෙක් මෙම රඳවා ගැනීම් මුදල නිදහස් කිරීමට කටයුතු කරනු නොලැබේ. | ක්‍රීඩාපිටිය පිළිසකර කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| නඩත්තු කිරීමට 2019 මැයි වන තෙක් කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) විශ්වවිද්‍යාලය සඳහා මධ්‍යගත තොරතුරු තාක්ෂණ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2010 වර්ෂයේදී රු. 1,819,966 ක් වැය කිරීමෙන් පසු එක් එක් පීඨය සඳහා වෙන් වශයෙන් පරිගනක මධ්‍යස්ථාන පිහිටුවා තිබීම සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර කාරක සභාවට වාර්තාවක් ලබා දෙන ලෙස 2017 අගෝස්තු 09 දින නියෝග කලද එකී වාර්තාව 2019 මැයි වනවිටත් ලබා දී නොතිබුණි. | 2017 ජූලි මාසයේ පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී මේ සඳහා පිළිතුරු ලබා දී ඇති බැවින් මෙම විගණන විමසුම ඉවත්කර ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි | දීර්ඝකාලීන සැලසුම් සම්බන්ධයෙන් වෙනස් නොවන පරිදි නිසි තීරණ ගත යුතුය. |
| (ඇ) ප්‍රධාන පුස්තකාලයෙන් බැහැරට දෙනු ලබන පොත් ආපසු භාර දීමේ ක්‍රමයක් හඳුන්වා දී නොතිබීම හේතුවෙන් 2014 වර්ෂයේ සිට 2018 ජූලි දක්වා බැහැර දෙනු ලැබූ පිළිවෙලින් රු. 387,959 ක් වටිනා පොත් 234 ක් හා රු. 106,620 ක් වටිනා පොත් 181 ක් 2018 දෙසැම්බර් වනවිටත් ආපසු භාර දී නොතිබුණි. මේ හේතුවෙන් මෙම පොත් අනෙකුත් පාඨකයන්ට පරිහරණය කිරීමේ අවස්ථාව අහිමි වී තිබූ අතර ඒවා ආපසු ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ද ගෙන නොතිබුණි. | අධ්‍යයන හා අනධ්‍යාන කාර්ය මණ්ඩලයෙන් ප්‍රමාද ගාස්තු හා දඩ අය නොකිරීමට තීරණය වී ඇත. නමුත් අවශ්‍ය අවස්ථාවලදී පුස්තකාල කමිටුව මැදිහත් වී අවශ්‍ය අයෙකුට පොත් ලබා දීමට කටයුතු කරයි. එමෙන්ම දීර්ඝ කාලයක් පුස්තකාල පොත් රඳවාගෙන සිටින සිසුන් සඳහා වරින් වර සිහිකැඳවීම් ලිපි යවා ඇත. | සාධාරණ කාලයක් තුළ පොත් ආපසු භාරදීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | ---------------------------------- | -------------- |
| (අ) පසුගිය අධ්‍යයන වර්ෂ 04 තුළදී ලියාපදිංචි කිරීමට යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව 5,421 ක් වූ අතර එයින් ශිෂ්‍යයන් 4,842 ක් පමණක් ලියාපදිංචි වී තිබුණි. ඒ අනුව ශිෂ්‍යයන් 579 ක් හෙවත් ලියාපදිංචි කිරීමට යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 11 ක් ලියාපදිංචි වී නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් තෝරා එවනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලියාපදිංචි කිරීමට අදාල කටයුතු පමණක් විශ්වවිද්‍යාලය මගින් කරනු ලබයි. කෙසේ වුවද මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන සිසුන් බඳවා ගැනීම කඩිනම් කර ඇති අතර සිසුන් පාඨමාලාවන් අතහැර යාම 2019 වර්ෂයේ සියයට 08 ක් දක්වා අඩු වී ඇත. | ශිෂ්‍ය ලියාපදිංචිය ඉහළ නැංවීම සඳහා විශ්වවිද්‍යාල පද්ධතියක් ලෙස ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2012/2013 අධ්‍යයන වර්ෂයේ සිට 2016/2017 අධ්‍යයන වර්ෂය දක්වා වූ අධ්‍යයන වර්ෂ 05 ක් තුළ විශ්වවිද්‍යාලයේ පීය 5ට පළමු වසර සඳහා ශිෂ්‍යයින් 5,585 ක් ලියාපදිංචි කර තිබූ අතර ඔවුන්ගෙන් ශිෂ්‍යයන් 91 දෙනෙකු හෙවත් සියයට 02 ක් පළමු වසර තුලම උපාධි පාඨමාලා හැරගොස් තිබුණි. | විදේශ ගත වීම, රැකියා කිරීම, වෙනත් පාඨමාලා හැදෑරීම හා පෞද්ගලික සහ අසනීප තත්ත්වයන් හේතුවෙන් පළමු වසර අභ්‍යන්තර සිසුන් සිය උපාධි පාඨමාලා හැර යෑම සිදු වී ඇත. | නියමිත කාලය තුල උපාධිය සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය ඉහළ නැංවීම සඳහා විශ්වවිද්‍යාල පද්ධතියක් ලෙස ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |
| (ඇ) 2011 වර්ෂයෙන් පසුව ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධිපාඨමාලාව නවීකරණය කර නව ශිෂ්‍ය කණ්ඩායම් බඳවා ගැනීමට 2019 අප්‍රේල් වනවිටත් කටයුතු කර නොතිබුණි. | මෙම පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියද ලබා ගැනීමට කටයුතු කර ඇත. | පාඨමාලාව නිසිපරිදි ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ)සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යය මණ්ඩලය, අනධ්‍යයන කාර්යය මණ්ඩලය හා ශිෂ්‍යයින්ගේ ඒක සේවක හා ශිෂ්‍ය පිරිවැය පිළිවෙලින් රු. 1,945,054, රු. 959,601 ක් හා රු. 360,608 ක් වූ අතර ඉකුත් වර්ෂයේ පිළිවෙලින් රු. 2,352,448 ක්, රු. 902,604 ක් හා රු. 319,082 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සාමාලෝචිත වර්ෂයේදී අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ඒක සේවක පිරිවැය රු. 407,410 ක අඩුවීමක්, අනධ්‍යනය කාර්යය මණ්ඩලයේ ඒක සේවක පිරිවැය රු. 16,997 ක වැඩිවීමක් හා ඒක ශිෂ්‍ය පිරිවැය රු. 41,526 ක වැඩිවීමක් වී තිබුණි. | සේවක සංඛ්‍යාව වැඩිවීම මෙන්ම ඔවුන්ගේ වැටුප්, දීමනා හා අතිකාල 2017 ට සාපේක්ෂව 2018 වසරේ රු. මිලියන 58 කින් ඉහළ යාම අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඒක සේවක පිරිවැය වර්ධනයට හේතු වී ඇත. අධ්‍යයන කාර්ය මණ්ඩලයට නව බඳවා ගැනීම් සඳහා 2018 වර්ෂයේදී පර්යේෂණ දීමනා සහිත සියලු දීමනා ඇතුලත් සම්පූර්ණ වැටුප නොගෙවීම නිසා සේවක සංඛ්‍යාව ඉහළ යාමේ ප්‍රතිශතයට සාපේක්ෂව අධ්‍යයන සේවක වැටුප් ඉහළ නොයාම අධ්‍යයන ඒක සේවක පිරිවැය අඩු වීමට හේතු වී ඇත. එමෙන්ම අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව වැඩි වීම, වැටුප්, දීමනා, ගමන් වියදම් සහ විභාග වියදම් වැඩි වීම ඒක ශිෂ්‍ය පිරිවැය වැඩිවීමට බලපා ඇත. | පෙර වර්ෂ සමඟ සාධාරණ විචලනයක් පවත්වා ගත යුතුය. |

## 3.4 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1998 අගෝස්තු 18 දිනැති අංක 737 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට විශ්වවිද්‍යාලයට අයත් බැඳුම්කර හා ගිවිසුම් කඩකිරීමේ අරමුදලේ රු. 36,634,800 ක් වූ ශේෂය අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය නොකර නිෂ්කාර්යව පැවතුණි. | මෙම මුදල් ස්ථාවර තැන්පතුවල තැන්පත් කර එම පොලිය නැවතත් එම ගිණුම් වලම ආයෝජනය කර ඉදිරි අවශ්‍යතා සඳහා සුරක්ෂිත අරමුදලක් ලෙස පවත්වාගෙන යනු ලැබේ. | අරමුදල පිහිට වූ නිශ්චිත අරමුණු සඳහා එම අරමුදල් උපයෝජනය කළ යුතුය. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)ව්‍යවහාරික විද්‍යාපීඨයට අදාලව පිටත පුහුණු ඒකකය (Out Bound Training Centre) පිහිටුවීම සඳහා ව්‍යාපෘතිය මගින් 2016 වර්ෂයේදී රු. 2,725,000 ක් වූ භාණ්ඩ හා උපකරණ විශ්වවිද්‍යාලයට ලබා දී තිබුණද, ඊට අදාළ යටිතල පහසුකම් සහ සැලසුම් සකස් කර නොතිබීම හේතුවෙන් 2019 මැයි වනවිටත් එම උපකරණ ඌණ උපයෝජිතව පැවතුණි. තවද 2013 සහ 2014 වර්ෂවලදී විශ්වවිද්‍යාලයට ලබා දී තිබූ රු. 725,776 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ සහ පුස්තකාල පොත් 2019 මැයි වනවිටත් ප්‍රයෝජනයට නොගෙන ගබඩා කර තිබුණි. | මේ සම්බන්ධයෙන් විගණන පරීක්ෂණයක් පැවැත්වෙන හෙයින් ඉදිරියේදී මෙම භාණ්ඩ, උපකරණ හා පොත්පත් ශාරීරික අධ්‍යාපන අංශයට හා පුස්තකාලයට ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. | ඌන උපයෝජිත භාණ්ඩ හා උපකරණ උපයෝජනයට ගැනීම සඳහා ක්‍රියා කළ යුතුය. |
| (ආ) වර්ෂයේ 2016 සිට අක්‍රීය වී තිබුණු විශ්වවිද්‍යාලයේ මුද්‍රණාලයේ ඇති ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට කටයුතු නොකර මුද්‍රණාලයම වසා දැමීමට තීරණය කර තිබීම නිසා ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ රු. 3,260,841 ක් වැයකර විශ්වවිද්‍යාලයේ මුද්‍රණ කටයුතු පුද්ගලික අංශයෙන් ඉටුකරවාගෙන තිබුණි. මුද්‍රණාලයේ පුහුණු සේවකයින් තිදෙනෙකු | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මුද්‍රණාලය ක්‍රියාකාරී තත්ත්වයට පත් කළ යුතුය. |

වෙනත් ඒකකයන්ට අනුයුක්ත කර තිබුණද රු. 449,664 ක් වූ පාරිභෝජන ද්‍රව්‍ය තොගය භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වී තිබුණි.

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ පෞද්ගලික ආරක්ෂක සේවා සැපයීම් කොන්ත්‍රාත්තුව 2017 ඔක්තෝබර් අවසන් වීමෙන් පසුව කොන්ත්‍රාත් කාලය අවස්ථා 04 දී දීර්ඝ කර ඒ වෙනුවෙන් රු. 34,159,488 ක් ගෙවා පසුව 2018 අප්‍රේල් නව කොන්ත්‍රාත්කරුවකු තෝරා ගෙන තිබුණි. එමෙන්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (අ) (vi)සහ 5.3.15(අ) වගන්ති ප්‍රකාරව කටයුතු නොකර 2017/2018 වර්ෂයේ පෞද්ගලික ආරක්ෂක සේවය සැපයීම සඳහා වූ ලංසු කැඳවීමට පූර්වයෙහි ලංසු ලේඛනවල අඩුපාඩු පවතින බව හඳුනා නොගෙන ප්‍රසම්පාදන දැන්වීම් තෙවරක් පලකිරීමෙන් පළමු හා දෙවන වර පුවත්පත් දැන්වීම් පලකිරීම සඳහා දරන ලද රු. 272,176 ක් නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | නියමිත කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගන්නා තෙක් ආරක්ෂාව රහිතව විශ්වවිද්‍යාලය පවත්වා ගත නොහැකි නිසාත්, ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවීම නිසා නව නේවාසිකාගාර සඳහා ආරක්ෂාව සැපයීමට සිදුවීම නිසාත්, පවතින නිර්ණායක අනුව පලකල පුවත් පත් දැන්වීමට සුදුසුකම් සහිත ලංසුකරුවන් නොසිටීමත්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා කාලයක් ගත වීමත්, දෙවන වර ලංදු කැඳවීමේදී දැන්වීම් පල කිරීමට හා ලංසු ලේඛණ නැවත සකස් කිරීමට කාලයක් ගත වීමත්, සේවක වැඩ වර්ජනයත් යන හේතූන් මත කොන්ත්‍රාත් කරුවෙකු තෝරා ගැනීමට කාල ප්‍රමාදයක් සිදු විය. කාලයගත වූවද විධිමත් ඇගයීම් පටිපාටියක් සකස් කර ගැනීමට හැකි වූ අතර එය ඔබ විසින් පෙන්වාදී ඇති තාක්ෂණික ගැටළු වළක්වා ගැනීමට හේතු වේ. ලංසු කැඳවීම රජයේ පුවත්පත්වල පැරණි මිලට ලබාගත් අතර ආයතනයට අලාභයක් සිදු කිරීමට කටයුතු නොකල බව සඳහන් කරමි. | මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතුය. |

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය ප්‍රකාරව කළමනාකරණ අධ්‍යයන, සමාජීය විද්‍යා හා භාෂා පීඨ සහ විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය සඳහා රු. 9,480,000 ක් වූ දේශනශාලා පුටු මිළදී ගැනීම් සඳහා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් දේශනශාලා පුටු සැපයීමේ ප්‍රමාද කාලය සඳහා ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි. . | සැපයුම්කරු එකඟතාවය කඩකලහොත් කාර්යය සාධන සුරක්ෂාව මුදල් බවට පත් කර ගන්නා බැවින් කොන්ත්‍රාත් ගිවිසුමක අවශ්‍යතාවය මතු නොවේ. ඇනවුම් කල භාණ්ඩ දින 30 ක් ඇතුලත දිය යුතු අතර පුටු වැනි භාණ්ඩ නිපදවා සැපයීම සිදු කරන බැවින් ප්‍රමාද ඇති වීම ස්වභාවිකයි. සැපයීම් ප්‍රමාදය සඳහා ප්‍රමාද ගාස්තු අය කළ හොත් සැපයුම්කරුවන් ඔවුන්ට මුදල් ගෙවීමේ ප්‍රමාදය මත ප්‍රමාද ගාස්තු අපගෙන් අය කරනු ඇත. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ කාල ප්‍රමාදය පිළිගන්නා අතර එය ප්‍රධාන සැලැස්මේ ඇස්තමේන්තුගත දිනය හා භාණ්ඩ ලැබීම් පත්‍රිකා නිකුත් කළ දිනය පදනම් කර ගෙන ගණනය කර ඇත. ප්‍රතිපාදන ලැබීම මත මිලදී ගැනීම් සිදු කරන බැවින් ඇස්තමේන්තු කාලය වෙනස් වීම ස්වභාවික වේ. | මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතුය. |

## 3.8 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්යය මණ්ඩලයේ විනේත්‍ර මහාචාර්ය තනතුරු (professor chair ) 17 ක ගෙන් තනතුරු 16 ක් ද, මහාචාර්ය තනතුරු හා කථිකාචාර්ය තනතුරු 300 ක ගෙන් තනතුරු 50 ක් ද, තාවකාලික කථිකාචාර්ය තනතුරු 53 කගෙන් තනතුරු 17 ක් ද, අනෙකුත් තාවකාලින අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු 98 ක ගෙන් තනතුරු 29 ක් ද වශයෙන් තනතුරු 112 ක පුරප්පාඩු පැවතුණි. | විශ්වවිද්‍යාලය සඳහා අනුමත කරන ලද පිරිස් ප්‍රතිපාදන(Cadre Report - 2017) අනුව අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ස්ථිර 78 ක් හා තාවකාලික හා කොන්ත්‍රාත් 53 පුරප්පාඩුව පවතී. විනේත්‍ර මහාචාර්ය තනතුරු දෙක සම්බන්ධයෙන් මතු වූ ගැටළු හේතුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා යොමු කර ඇත. අනෙකුත් මහාචාර්ය හා කථිකාචාර්ය තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 50 දක්වා අඩු වී ඇත. අනුමත තාවකාලික කථිකාචාර්ය තනතුරු 03 ක් බඳවා ගැනීමට නියමිත අතර තාවකාලික අධ්‍යයන කාර්යමණ්ඩලයේ තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 29 දක්වා අඩු වී ඇත. අවස්ථාවෝචිතව බාහිර කථිකාචාර්ය වරුන්ගේ සේවය ලබා | පුරප්පාඩුව පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ගැනීමට ද කටයුතු කරනු ලැබේ. | |
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරපාඩු සංඛ්‍යාව 154 ක් වූ අතර පරිපාලන, මූල්‍ය හා විධායක නිළධාරීන් 08 ක්, වෛද්‍ය නිලධාරී තනතුරු 02 ක්, අධ්‍යයන සහය කාර්ය මණ්ඩල තනතුරු 10 ක්, තාක්ෂණික කාර්ය මණ්ඩල තනතුරු 38 ක්, ලිපිකරු හා සහයක කාර්ය මණ්ඩල තනතුරු 28 ක් සහ ප්‍රාථමික කාර්ය මණ්ඩල තනතුරු 66 ක් එම පුරප්පාඩුවලට ඇතුලත් වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී නිවාඩු දින වැටුප් හා අතිකාල දීමනා වශයෙන් රු. 27,386,712 ක් ගෙවීමට පුරප්පාඩු පැවතීමද හේතු වී තිබුණි. | පරිපාලන තනතුරු වලට බඳවා ගැනීම සඳහා කටයුතු කරමින් පවතින අතර, ව්‍යාපෘති කළමනාකරණ හා වෛද්‍ය නිළධාරී තනතුර සඳහා අයදුම්පත් ලැබී නොමැත. අධ්‍යයන සහයක පුරප්පාඩු 10 පිරවීමටද කටයුතු කරනු ලැබේ. 2018 වර්ෂයේ දී අනධ්‍යන කර්යමණ්ඩල පුරප්පාඩු තනතුරු 07 කට 64 දෙනෙකු බඳවා ගන්නා ලදී. සේවයෙන් ඉල්ලා අස්වීම, විශ්‍රාම යාම, ස්ථාන මාරුවීම්, උසස්වීම් හා මරණ හේතුවෙන් මෙම පුරප්පාඩු ඉහළ යාමට හේතු වී තිබුණි. | පුරප්පාඩුව පිරවීමට කටයුතු කළ යුතුය. |

**4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

------------------------------------------

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-----------------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත් වාර්ෂික වාර්තාව සමඟ වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 02 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | සහකාර මූල්‍ය අධිකාරීවරුන්ගේ ස්ථාන මාරුවීම ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරයෙකුගේ සහ මුදල් අංශයේ පොත් තබන්නා තනතුරුවල පවතින පුරප්පාඩු සහ නව සහකාර මූල්‍යාධිකාරීවරුන් තනතුරු භාර ගැනීම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයට බලපා ඇත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |

**4.2 අභ්‍යන්තර විගණනය**

-------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 ඔක්තෝබර් අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර තිබුණ ද 2019 මැයි වන විටත් කිසිදු අභ්‍යන්තර විගණන විමසුමක් නිකුත් නොකිරීමට විගණක | 2019 වර්ෂය ආරම්භයේදී විගණන සහායක තනතුරු 02 පිරවීම සඳහා අවශ්‍ය අයදුම්පත් කැඳවා තිබු අතර සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් එම තනතුරු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. තවද, මේ වනවිට විශ්වවිද්‍යාලයේ | පුරප්පාඩු පුරවා සැලසුම් ප්‍රකාරව කටයුතු |

| | | |
|---|---|---|
| සහායක තනතුරු 02 ක පවතින පුරප්පාඩු ද හේතු වී තිබුණි. | අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්යක්ෂමතාව පරීක්ෂා කර අභ්‍යන්තර විගණන විමසුම් නිකුත් කර ඇත. | කළ යුතුය. |

**4.3 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)සමාලෝචිත වර්ෂය තුළ පුනරාවර්තන වියදම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු. මිලියන 1,136.22 ක් වූ අතර එහි තත්‍ය වියදම රු. මිලියන 1,363.71 ක් වූයෙන් ප්‍රතිපාදනය ඉක්මවා රු. මිලියන 227.49 ක් හෙවත් සියයට 20 ක් වැය වැය කර තිබුණු අතර ප්‍රාග්ධන වියදම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු. මිලියන 450 ක් වූ අතර එහි තත්‍ය වියදම රු. මිලියන 492 ක් වීමෙන් ප්‍රතිපාදන ඉක්මවා රු. මිලියන 42.3 ක් හෙවත් සියයට 9 ක් වැය කර තිබුණද ඒ සඳහා සංශෝධිත අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | සේවක වැටුප් වැඩිවීම හා නව බඳවා ගැනීම් සඳහා අපගේ පාලනයෙන් තොරව රජයේ ප්‍රතිපාදන වැඩිවීම හා අභ්‍යන්තර ආදායම වැඩිවීම මත අපගේ ආදායම රු. මිලියන 1,282.8 දක්වා වර්ධනය විය. මුළු වියදම රු. මිලියන 1,363.7 බැවින් සත්‍ය වියදම සියයට 6 කි. ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් ඉදිකිරීම් කොන්ත්‍රාත්, ප්‍රාග්ධන පුනුරුත්ථාපනය, ප්‍රාග්ධන භාණ්ඩ මිළදී ගැනීම නියමිත කාලය තුල සිදු කිරීමට හැකි වීම අයවැය ප්‍රතිපාදන ඉක්මවා උපයෝජනය වර්ධනය කිරීමට හේතු විය. | ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස අයවැය ලේඛනය යොදා ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) ස්වයං මූල්‍ය පාඨමාලාවල ආදායම් සහ වියදම් සඳහා පිළියෙල කර තිබූ ඇස්තමේන්තු සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ අයවැය ලේඛනයට ඇතුළත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ එම පාඨමාලාවල ආදායම් හා වියදම් පිළිවෙලින් රු. මිලියන 70.63 ක් හා රු. මිලියන 39.01 ක් විය. | ස්වයං මූල්‍ය පාඨමාලා ආදායම් වියදම් ජනිත කරනු ලබන්නේ බාහිර විභාග ව්‍යාප්ති ඒකකය හා පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය මගින් වන අතර එම ආයතන දෙකම වෙනම පාලන මණ්ඩලයක් මගින් පාලනය වන බැවින් මෙහි ආදායම හෝ වියදම විශ්වවිද්‍යාලයේ අයවැය ලේඛණයට ඇතුලත් කොට නොමැත. | විශ්වවිද්‍යාලයේ අයවැය ලේඛනය ට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

**4.4 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් 2030 " න්‍යාය පත්‍රය" පිළිබඳව ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය දැනුවත්වී තිබුණද, සිය විෂය පථයට අනුව ළඟා කර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ හෙයින් ඒ හා සම්බන්ධවන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟා විය යුතු සංධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව විශ්වවිද්‍යාල සභාවේ සාකච්ඡා කර ඇති අතර ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. | තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධ දිගුකාලීන සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතුය. |